# සමෘද්ධි බැංකු සංගම් හි

# ලාභ විසර්ජන අනුපාතයන් සංශෝධනය කිරිම

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස්**

**පත්‍රිකා අංක 12 ට දහවන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,

   සමෘද්ධි බැංකු සංගමය, ...............................

2. කළමනාකරු,

   සමෘද්ධි බැංකු සංගමය, ...............................

3. සභාපති, විධායක කමිටුව,

   සමෘද්ධි මහ සංගමය, .............................

4. කළමනාකාර අධ්‍යක්ෂ,

   සමෘද්ධි මහ සංගමය, .........................................

5. මුලස්ථාන කළමනාකරු,

   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ........................................

6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,

   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .......................................

7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, .......................................

8. දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, .......................................

9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, .......................................

10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

12. ලේකම්,

    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,

    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,

    කොළඹ 10.

**බැංකු මූල්‍ය කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.08.19**

දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.08.19

# සමෘද්ධි බැංකු සංගම් හි
# ලාභ විසර්ජන අනුපාතයන් සංශෝධනය කිරිම.

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන**
**මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට දහවන එකතුව**

**1.** සමෘද්ධි බැංකු සංගම් හී ලාභ විසර්ජන අනුපාතයන් මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට හත්වන හා අටවන එකතුව සංශෝධනය කරන ලදී.

1.1 එම අනුපාතයන්ට අනුව අදාල වෙන්කිරීම් සිදුකර විසර්ජන කටයුතු ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය කටයුතු අංශයේ අනුමැතිය මත සිදුකරන ලෙසට ඒ තුලින් කළමනාකරුවන් වෙත උපදෙස් ලබා දී ඇත.

1.2 මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට 7 හා 8 තුලින් සේවක දිරි දීමනා සඳහා වෙන්කර තිබූ ප්‍රතිශතයන් සංශෝධනය කරනු ලබිණි.

1.3 මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට 8 තුලින් නැවතත් බැංකු ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා සේවක අභිප්‍රේරණය සඳහා වූ ප්‍රතිශතය ද වැඩිකරන ලදී.

**2.** ඉහත තත්වයන් යටතේ සංශෝධනය කරන ලද සේවක අභිප්‍රේරණය සඳහා වූ ප්‍රතිශතයට බැංකු කළමනාකරුට හා සහකාර කළමනාකරුට හිමිකම් නොලැබිණ.

2.1 මෙම තත්ත්වය සලකා බලා බැංකු කළමනාකරුට හා සහකාර කළමනාකරුට සේවක අභිප්‍රේරණය යටතේ යම් ප්‍රතිශතයක් ලබාදීම සුදුසු බව තීරණය කර ඇත.

2.2 ඒ අනුව, සේවක අභිප්‍රේරණය හා සුභ සාධන කටයුතු සඳහා වෙන්කරන ලද 5% තුලින් බැංකු කාර්ය මණ්ඩල පුහුණුවීම් සඳහා වෙන්කර ඇති 15% න් 5% ක් ලබාගෙන එය පහත සඳහන් පරිදි විසර්ජනය කිරීමට අනුමැතිය ලබාදෙමු.

2.3 ඒ අනුව පුහුණුවීම් සඳහා වෙන්කරනු ලබන මුළු ප්‍රතිශතය 10% ක් වේ.

2.4 පුහුණුවීම් සඳහා වූ 15% තුලින් 5% ක් ලබාගත් පසු එය පහත සඳහන් ප්‍රතිශත යටතේ කාර්ය මණ්ඩලය වෙත පහත පරිදි විසර්ජනය කළ යුතුය.

| | | |
|---|---|---|
| 1. බැංකු කළමනාකරුට | - | 40% |
| 2. සහකාර කළමනාකරුට | - | 20% |
| 3. බැංකු ලිපිකරු කාර්ය මණ්ඩල හතර දෙනා සඳහා | - | 40% |
| | - | 100% |

2.5 බැංකු ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා පෙර වෙන්කර තිබූ 5% ද, (අභිප්‍රේරණය යටතේ) එලෙසම නොවෙනස්ව පවතී. ඒ අනුව බැංකු ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා සේවක අභිප්‍රේරණය යටතේ ලැබෙන මුළු ප්‍රතිශතය 45% ක් වේ.

**3.** මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට 7 තුලින් සේවක අභිප්‍රේරණය සඳහා වෙන් කරන ලද 5% තුලින් කාර්ය මණ්ඩල සුභසාධන සඳහා වෙන්කර ඇති 10% පහත සඳහන් කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ (බැංකු මූල්‍ය) ගේ අනුමැතිය මත වියදම් කිරීම සිදුකළ හැක.

3.1 පාලක මණ්ඩල සාමාජිකයන් සඳහා ඇතිවන්නා වූ මූල්‍යමය අවශ්‍යතා සඳහා ණය මුදලක් ලබාදීම/ වෛද්‍යමය කටයුත්තක් සඳහා ණය මුදලක් ලබාදීම.

3.3. එලෙස ලබාදිය හැකි ණය මුදල උපරිමය රු.5000 ක් පමණ වන අතර, ආපසු අය කර ගැනීම හා නිකුත් කිරීම බැංකු සංගමයේ පාරිභෝගික ණය අය කර ගන්නා ක්‍රමවේදය යටතේ සිදුකළ හැකිය.

3.4 මෙම ඉල්ලීම් ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය මත සිදුකළ යුතුය.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

සී.ඩී.කළුආරච්චි,
සාමාන්‍යාධිකාරී,
අධ්‍යක්ෂ බැංකු මූල්‍ය කටයුතු (වැ.බ)

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය
කටයුතු හා මහ සංගම්.